# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය

කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ. පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය අපේක්ෂකයින් වෙතින්, අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර ජාලකරණ කළමනාකරු
## II වන ශ්‍රේණිය - පුරප්පාඩු - 01 යි

**1. සුදුසුකම් :**

(I) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) විශේෂ උපාධියක පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක්.

හෝ

(II) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (B.Sc) (විශේෂ) උපාධියක් සමත්වීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක භාවිතය විෂය සංඝටකයක් ලෙස ලත් විද්‍යාවේදී (B.Sc) (සාමාන්‍ය) උපාධියක පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක්

සහ

(ආ) පරිගණක භාවිතය, ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ එක් (01) වසරක පළපුරුද්ද.

හෝ

(III) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, පරිගණක භාවිතය (Computing) විෂය සංඝටකයක් ලෙස ලත් විද්‍යාවේදී (B.Sc) සාමාන්‍ය උපාධි සාමාර්ථයක්.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (පරිගණක භාවිතය (Computing) විෂය සංඝටකයක් නොවන) විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක, පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක්.

සහ

(ආ) පරිගණක භාවිතය, ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද.

හෝ

(IV) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (පරිගණක භාවිතය (Computing) විෂය සංඝටකයක් නොවන) විද්‍යාවේදී (B.Sc) සාමාන්‍ය උපාධියක සාමාර්ථයක්.

සහ

පරිගණක භාවිතය, ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ, වසර තුනක (03), පළපුරුද්ද.

හෝ

(V) වෙනයම් උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණ වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

සහ

පරිගණකය භාවිතය / ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ, එක් (01) වසරක පළපුරුද්ද.

හෝ

(VI) විශ්වවිද්‍යාල සේවයේ, පරිගණක ක්‍රමලේඛක (Computer / Programmer) වරයෙකු ලෙස වසර 15 ක පළපුරුද්ද.

**2. බඳවා ගැනීමේ ක්‍රමවේදය**

අභියෝග්‍යතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**3. වැටුප් පරිමාණය :**

රුපියල් : 50,625-3X1,335 - 54,630 (EB) 55,965 - 14X1,335 - 74,655 (මාසිකව) U-AS 2 (II), 2020-01-01 වන දිනට

ඉහත සඳහන් වැටුපට අතිරේකව, ජීවන වියදම් දීමනාව (COL) හා වෙනත් අදාළ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

**4. වෙනත් ප්‍රතිලාභ :**

➢ **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල** (UPF) :

සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට (UPF) මාසික මූලික වැටුපෙන්, 7% කට සමාන වන මුදලක් / අගයක්, දායකවනු ඇත. සේවකයා විසින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට (UPF) සිය මාසික මූලික වැටුපෙන් 10% කට සමාන අගයක් ලෙස, දායකත්වය සපයනු ඇත.

➢ **විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** :

සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට, මාසික මූලික වැටුපෙන්, 8% ක අගයක් ලෙස දායක වනු ඇත.

➢ **සේවා නියුක්තයින්ගේ භාර අරමුදල** (ETF) :

සේවා යෝජකයා විසින් සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) ට, මාසික මූලික වැටුපෙන්, 3% ක් වන අගයට සමාන වටිනාකමක් දායක වනු ඇත.

**5. වැදගත් :**

➢ උසස් අධ්‍යාපන ආයතන / රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

➢ අදාළ සහතික පත්‍රවල පිටපත්, අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

➢ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘති පත්‍රයට නොඅනුකූලව ඉදිරිපත් කරනු ලබන, අනනුකූල අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව, භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

➢ අයදුම්පත්, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) හි, වෙබ් අඩවිය වන www.iim.cmb.ac.lk යන වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය.

➢ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතික පත්‍රවල පිටපත් ද සමග, 2020-10-09 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, රාජගිරිය, කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) හි, සහකාර ලේඛකාධිකාරී / ආයතන, වෙත, ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. අයදුම්කරනු ලබන තනතුර, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

**අධ්‍යක්ෂක,**
**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය.**